ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(i)	උපයෝජන තත්වයේ පවතින රු.343,815,632 ක් වටිනා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල වත්කමක් ලෙස ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව නොනිමි වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.	වැඩ නිමි කාර්යාල ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන බව දන්වා තිබුණි.	වැඩ නිමි ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ආදායම් ලැබීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් ලද රු.581,655 ක ආදායම රු.374,000 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස රු.207,655 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	ඇතැම් ප්‍රාදේශීය ලේකම් කායීාල වෙන්දේසි ආදායම ආදායම් ශීර්ෂයේ ගිණුම්ගත නොකර රජයේ ආදායම් යටතේ ගිණුම්ගත කිරීමෙන් වෙනස හටගෙන ඇති බැවින් නිවැරදිව ගිණුම්ගත කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කායීාල දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	වෙන්දේසි ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයන් 04 ක ප්‍රතිපාදන ඉතිරිය, දෙපාර්තමේන්තු වැය ලෙජරය සමඟ සැසඳීමේදි රු.1,165,797 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	130 වැය ශීර්ෂය යටතේ පැවති දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය, 2024 වර්ෂයේ සිට 278 වැය ශීර්ෂයට ඇතුළත් කර ඇති නිසා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා දෙපාර්තමේන්තු වැය ලෙජරය අතර වෙනස්කම් සිදු වී ඇති බව දන්වා තිබුණි.	භාණ්ඩාගාර මුද්‍රිත හා දෙපාර්තමේන්තු වැය ලෙජරය සසඳා නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) තැන්පතු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 හි සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තැන්පතු ගිණුම් ශේෂයන් එකතුව රු. 257,940,243 ක් වුවද 278 ශීර්ෂයට අදාළව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ තැන්පතු ගිණුම් ශේෂ වටිනාකම රු. 257,739,304 ක් වීමෙන් රු.200,939 ක වෙනසක් පැවතුණි.	පොදු තැන්පතු ගිණුමෙහි පවතින රු.200,940 ක ශේෂය වෙනස්වීමේ වරද නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	විධිමත් පරිදි සැසදීම් කර ශේෂයේ පවතින වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන වලට අදාළව විගණනයේදී නිරීක්ෂණය කරන ලද දේපළ පිරියත හා උපකරණ අගය රු.10,101,641,809 ක නොසැසදීම,සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය මඟින් ගැලපුම් කර තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.	සිගාස් වැඩසටහන (UPB) තුළ ඇති එහෙත් පවැතිය නොහැකි ස්ථාවර වත්කම් ශේෂයන් ඉවත් කර වැරදි නිවැරදි කර ඇති බව දන්වා තිබුණි.	වැරදි නිවැරදි කිරීමට අදාළ සාක්ෂි සහිතව ජර්නල් වවුචර් ඉදිරිපත් කළ යුතුය.
(ii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඉඩම් ගොඩනැගිලි හා වාහන අයිතම 06 ට අදාළ රු. 443,015,424 ක්වූ ශේෂ සනාථ කර ගැනීමට අදාළ ප්‍රාග්ධනීත කළ පිරිවැය වටිනාකම හෝ තක්සේරු වටිනාකම ඇතුළත් මූලාශ්‍ර ලේඛන ඉදිරිපත් නොකෙරුණි.	අදාළ මූලාශ්‍ර ලේඛන ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ප්‍රාග්ධනීත කළ වටිනාකම් වලට අදාල විගණනයට ඉල්ලූ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන;

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව මා ප්‍රකාශ කරමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ ශීර්ෂ 278 සඳහා සැලසුම අනුව ඉල්ලුම් කල යුතු අග්‍රිමයට වඩා ඉල්ලුම් කල අග්‍රිමය රු.මිලියන 2,047,269 කින් අඩු අගයක් ගෙන තිබුණි.	වෙළඳපළ ගැටලු නිසා ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නිම කිරීමට නොහැකිවීමෙන් සැලසුම් කළ ආග්‍රිමය හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස්කම් ඇතිවී ඇත. එසේම තැන්පත් ගිණුම් හා අත්තිකාරම් ගිණුම් සඳහා අග්‍රිම ඉල්ලුම් කළද ඒ සඳහා ඉල්ලුම් කළ පරිදිම අග්‍රිම නොලැබුණු බැවින් එම වෙනස්කම් ඇති වන බව දන්වා තිබුණි.	අග්‍රිම අවශ්‍යතා සැලසුම් කිරීමේදී භෞතික තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන හැකිතාක් නිවරදිව සකස් කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 13 ක ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිවීම් සියයට 22ත් - සියයට 70 ත් අතර පරාසයක පැවැතිණි..	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් ඉතාම පිරිමැසුම්දායක ලෙස කලමනාකරණය කිරීම තුළින් වියදම් අවම වීම හේතුවෙන් වූ ඉතිරිවීම් හා බිල්පත් අදාළ ආයතන වලින් ඉදිරිපත් නොවීම ආදී හේතුන් බලපා තිබුණි.	මුදල් රෙගුලාසි 50 (11) ට අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවරදිවත්, සම්පූර්ණවත් පිළියල කළ යුතු අතර වෙන්කළ ප්‍රතිපාදන ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා පූර්ණ උපයෝජනය කළ යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 කට වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 48 කින් අවශ්‍යතා 94 ක් සඳහා ලබාදුන් රු. මිලියන 946.9 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂ අවසානයේ රු. මිලියන 151.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.	ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම, ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම, වවුචර් ඉදිරිපත් නොවීම හා අවශය කටයුතු සිදු කරමින් පැවතීම ආදී හේතු නිසාවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ඉතිරි ප්‍රතිපාදන පවරා දීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	අදාළ රේඛීය අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා මහා භාණ්ඩාගාරය සමඟ වර්ෂයේ මුල් භාගයේ සිටම නිරන්තර සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කර ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතුවීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 මුදල් රෙගුලාසිය	2,604,482	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු 27 ක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.	කල් ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	විධිමත් පරිදි කටයුතු කර කාලය ඉක්මවා ඇති පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 571 අනුව කටයුතු කළ යුතුවීම.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ				
(i)	2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයේ 1.4 මාර්ගෝපදේශය		ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් පුරවැසි ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කර නොතිබුණි.	පුරවැසි සේවා ප්‍රඥප්තිය යාවත්කාලින කරමින් පවතින අතර ඉදිරියේදී පුවරුව සකස් කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	පුරවැසි ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වාහන 21 ක් වෙනුවෙන් 2024 වර්ෂය තුල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.	වාහන සඳහා ඉන්ධන දහනය වීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ඉන්ධන කාර්යක්ෂමතාවය හඳුනාගැනීම සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුය.
(iii)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මගින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් 2024 අගෝස්තු 15 වන විටත් පිළියෙල කර නොතිබුණි.	මානව සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඉදිරියේදී මෙවන් අතපසුවීම් සිදු නොවීමට වගබලා ගන්නා බවට සඳහන් කර තිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 135 යටතේ 2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් පාලනය සම්බන්ධ බලතල පැවරීම ප්‍රකාරව රු.500,000 කට වැඩි වාහන අලුත්වැඩියා සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු වුවත් වවුචර් අංක 347 මගින් ගෙවීම් කල රු.908,750ක අලුත්වැඩියාව සඳහා මුදල් රෙගුලාසි 137 අනුව අනුමත කිරිමේදී බලයක් නොමැතිව හා අලුත්වැඩියාව සම්බන්ධ මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය නොමැතිව ගෙවීම සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර 2025 අප්‍රේල් 03 දින වන විට ඉහත මුදල නැවත පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.	5/2022 චක්‍රලේඛය අනුව අලුත්වැඩියාව ප්‍රාදේශීය ගරාජයකින් සිදු කරන විට අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය අවශ්‍ය නොවන බව දන්වා තිබුණි.	වාහන අලුත්වැඩියාවේදී මූල්‍ය බලතල සීමාවන් තුළ කටයුතු කළ යුතු අතර එසේ කර නොමැති පාර්ශව වෙත පියවර ගත යුතුය.

3.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනහඩුව වසමේ ඛනිජ කැනීම සඳහා හෙක්ටයාර 94.6174ක භූමි ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට ලබා දීමේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සිදු කළ යුතු සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නොමැතිව, පුරාවිද්‍යාත්මක වටිනාකමැති ස්ථාන තිබියදී හඳුනාගැනීමකින් තොරව හා බදු ගිවිසුමකට එළඹීමකින් තොරව වාර්ෂික බද්ද රු.6,504,000 ක මුදලක් අයකර 2022 සැප්තැම්බර් 12 දින භුක්තිය ලබා දීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කටයුතු කර තිබුණි.	ගැටළුකාරී තත්වයන් විසඳා ගැනීම පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස් අනුව කටයුතු කර ගැටළුකාරී තැන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	විධිමත් පරීක්ෂණයක් සිදුකර අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ක්‍රියා කිරීම ඇතුළු අනෙකුත් කරුණු සම්බන්ධයෙන් අදාල පාර්ශව වෙත පියවර ගත යුතුය.

3.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නිලධාරියා මිය ගොස් මාස 03 සිට මාස 36 ක් කල්ගත වී තිබුණු, ස්ථාන මාරු වී මාස 05 ක කාලයක් ගතවී තිබුණු , වැඩ තහනම් කළ අවසාන වාරිකය අයකර මාස 06 සිට අවුරුදු 12 දක්වා කිසිදු වාරිකයක් අය නොකළ හා විශ්‍රාම ගොස් මාස 03 සිට මාස 12 ක් දක්වා කල් ගත වී තිබුණු නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2.937,013 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අය වී නොතිබුණි.	විශ්‍රාම ගිය සහ මිය ගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අදාළ ප්‍රතිපාදන මගින් ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන අතර වැඩ තහනම් වූ නිළධාරීන්ගේ ණය ශේෂයන් පිළිබඳව සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති බැවින් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	හිඟ ණය කාලීනව අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැය රු.22,764,925 ක් වූ ව්‍යාපෘති 28 ක් නිම නොකර අතහැර දමා තිබුණි.	පැවති අයහපත් කාලගුණය, භූ විද්‍යා විමර්ශණ වාර්තා ලබා ගැනීම ප්‍රමාද වීම ආදි හේතු මත ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.	ලැබෙන ප්‍රතිපාදන මුදල් ප්‍රදේශයේ සංවර්ධනයට යෙදවීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන්ට පියවර ගත යුතු අතර අනුමත ව්‍යාපෘති නියමිත කාල වකවානුව තුළ නිම කිරීමට හැකි වන පරිදි විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතුය.
(ආ)	ගම සමඟ පිළිසඳර වැඩ සටහන යටතේ 2023 වර්ෂයේ දී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සේවා පියසක් ඉදිකිරීම සඳහා රු.1,199,947 ක ප්‍රතිපාදනයක් අනුමත වී තිබුණු අතර ඉන් රු.333,648 ක වැඩ ඉටුකර ව්‍යාපෘතිය අතරමඟ නවතා තිබුණි.	මෙම කාල වකවානුවේ රටේ පැවති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් ඉන්ධන හා සිමෙන්ති සපයාගත නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අවසන් කරගත නොහැකි වී ඇත. ඉදිරි සංවර්ධන යෝජනා ලබා ගැනීමේදී මේ සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට කටයුතු කරන බව සඳහන් කර තිබුණි.	- එම -

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක ව්‍යාපෘති 39 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමෙ ක්‍රියාවලිය 1980 වසරේ සිට 2023 වර්ෂය අතර කාලය තුළ ආරම්භ කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කර ගැනිමෙ කටයුතු නිම වී නොතිබුණි.	ඉඩම් අමාත්‍යවරයාගේ නිර්දේශය ප්‍රමාද වීම, මැනුම් කටයුතු ප්‍රමාද වීම, අධිකරණ කටයුතු පැවතීම ආදී හේතුන් බලපා ඇති බව දන්වා තිබුණි.	ප්‍රමාද වීම සඳහා බලපෑ කරුණු සමාලෝචනය කර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමේ වැඩපිළිවෙලක් සකසා යෝජිත ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

(ආ)	රත්නපුර දිස්ත්‍රික්කයේ 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂයන්හි ගංවතුරින් හා නාය යාම් වලින් හානියට පත් මුළු නිවාස ගණන 26,572 ක් වූ අතර ලබා දිය යුතුව තිබූ මුළු වන්දි මුදල රු.1,106,840,660 ක් වුවද 2024 දෙසැම්බර් 31 වන විට ඉන් තවදුරටත් ලබා දිය යුතු වන්දි මුදල් රු.762,317,467 ක් ව පැවතුණි.	නොගෙවා ඇති වන්දි මුදල් සඳහා බලපා ඇති ප්‍රධාන හේතුව ප්‍රතිපාදන නොලැබීම බව දන්වා තිබුණි.	සමස්ථ ක්‍රියාවලියම සමාලෝචනය කර විධිමත් පරිදි ප්‍රතිපාදන ඉල්ලුම් කර වන්දි ලබාදීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ගංවතුර හා නායයාම් නිසා හානියට පත් නිවාස වෙනුවෙන් එකතුව රු.83,990,000 ක වන්දි මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභී පවුල් 104 ක් වෙත ලබාදී තිබුණද එම නිවාස අඩක් නිමකල තත්ත්වයේ පැවති අතර ප්‍රතිලාභී පවුල් අධි අවධානම් ස්ථාන වල හෝ වෙනත් තාවකාලික ස්ථානවල පදිංචිව ඇති බව නිරීක්ෂණය විය.	ප්‍රතිලාභීන්ට අදාල නිවාස ඉදිකිරීම් කටයුතු කඩිනම් කර ප්‍රතිලාභීන් පදිංචි කරලීමට හා පැරණි නිවාස කඩා ඉවත් කිරීමට කටයුතු කරන අතර, තව දුරටත් ඉදි කිරීම් නොකරන ප්‍රතිලාභීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	නිවාස ඉදිකිරීම් කටයුතු පිළිබඳව අඛණ්ඩ අධීක්ෂණයක්, පසුවිපරමක් සිදු කර ප්‍රතිලාභී පවුල් කඩිනමින් පදිංචි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(ඈ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභී පවුල් 10 ක් වෙත නායයෑම් අවදානම හේතුවෙන් නැවත පදිංචි කිරීම් සඳහා එකතුව රු.2,800,000 ක මුදලක් ලබාදී තිබුණද කිසිදු භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.	සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඉදිකිරීම් කටයුතු සිදු කරලීමට හෝ අයකර ගැනීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ව්‍යාපෘති අධීක්ෂණය කර අපේක්ෂිත අරමුණු ඉටු කරවා නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් සිදු කර ව්‍යාපෘති නිම කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉදිකිරීම් මාර්ගෝපදේශයෙහි පියවර 08 අනුව ආපදා ගම්මාන සඳහා යටිතල පහසුකම් වන ජලය,විදුලිය හා ප්‍රවේශ මාර්ග සම්පාදනය කල යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ආපදා ගම්මාන සඳහා ජල පහසුකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 01 ක ආපදා ගම්මාන සඳහා විදුලි පහසුකම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ආපදා ගම්මාන සඳහා ප්‍රවේශ මාර්ග පහසුකම් සම්පාදනය කර නොතිබුණි.	යටිතල පහසුකම් සැපයීම සඳහා අදාල ආයතන ලිඛිතව දැනුවත් කරන බව දන්වා තිබුණි.	විධිමත් පරිදි ව්‍යාපෘතිය සැලසුම් නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව වෙත පියවර ගැනීමටත්, ඉදිකිරීම් මාර්ගෝපදේශයට අනුකූලව අදාළ පහසුකම් කඩිනමින් ලබා දීමටත් කටයුතු කළ යුතුය.

(ඊ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 කට අයත් ඉඩම් 183 ක් පමණ විවිධ රජයේ ආයතන විසින් පවරා ගැනීමට ඉල්ලුම් කර ඇතත් 2024 දෙසැම්බර් 31 වන විටත් අදාල කටයුතු අවසන් වී නොතිබුණි. මෙම ඉඩම් පවරා ගැනීමට ඉල්ලුම් කල කාලසීමාව 1997 – 2021 වර්ෂ දක්වා වන බවට වැඩි දුරටත් නිරීක්ෂණය විය.	ඉඩම් තක්සේරු කිරීම, නීතිමය කටයුතු, අදාළ රාජ්‍ය ආයතනවල නිර්දේශයන් ලබා ගැනීමට ප්‍රමාද වීම ආදි හේතුන් බලපා ඇති බව දන්වා තිබුණි.	ඉඩම් පවරා දීමේ කටයුතු ප්‍රමාදවීම සඳහා බලපෑ හේතූන් සමාලෝචනය කර ඉඩම් පැවරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.

4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කාර්යසාධනයට අදාලව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ අනුකූලතා වාර්තාවේ අවශ්‍යතා 63 ක් වෙනුවෙන් අනුකූල වේ යනුවෙන් දක්වා තිබුණි. ඉන් අවශ්‍යතා 10 ක නියැදියක් පරීක්ෂා කිරිමේ දී අවශ්‍යතා 05 ක අනුකූල නොවීම් නිරික්ෂණය විය.	නිවරැදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	නිවැරදි නොවූ තොරතුරු ඇතුළත් කර වාර්තාව සැකසූ පාර්ශව වෙත පියවර ගැනීමටත්, නිවැරදිව තොරතුරු ඇතුළත් කර වාර්තාව සැකසීමත් කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවිත්‍රතා සේවාව පවත්වාගෙන යාමේදී 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 5.2.1(අ) ප්‍රකාරව ලංසුකරුවෙකුට ප්‍රතිචාරාත්මක ලංසුවක් පිළියළ කිරීමට අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් කිරීමෙන් තොර වීම මත පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, සේවක අර්ධ සාධක අරමුදල හා ආයතනයේ ලාභාංශවෙනම හඳුනා ගැනීමට නොහැකි වන පරිදි ලංසු කැඳවීම් සිදු කර තිබීමෙන් පවිත්‍රතා කටයුතු සඳහා භාවිතා කළ යුතු අමුද්‍රව්‍ය හා උපකරණ ප්‍රමාණාත්මකව හඳුනාගැනීම අපහසු වී තිබුණි.	විගණන විමසුමෙන් පෙන්වා දුන් කරුණු සටහන් කර ගත් බවත්, ඉදිරි මිල ගණන් කැඳවීමේදී එම අඩුපාඩු මඟහරවා ගනිමින් කටයුතු කරන බවත් දන්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ යොමුගත වගන්ති ප්‍රකාරව ලංසුකරුවකුට ප්‍රතිචාරාත්මක ලංසුවක් පිළියෙල කිරීමට හැකිවන පරිදි ලංසු ලේඛන සකස් කළ යුතුය.

(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2024 වර්ෂයට අදාළ සනීපාරක්ෂක සේවා ලබා ගැනීම හා ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේදී පෙර වර්ෂ වල සිට මිල ඉදිරිපත් නොකරන ආයතන වෙත මෙම වසරේද මිල විමසීම් යැවීම සිදු කර තිබුණද එම ආයතන ප්‍රතිචාර නොදැක්වීම මත මිල ඉදිරිපත් කරන ආයතන එකක් හෝ දෙකක් පමණක් පදනම් කරගෙන උපරිම තරඟකාරී මිල විමසුමකින් තොරව ලංසුකරු තේරීම කර තිබුණි.	2024 වර්ෂය තුළ ව්‍යාපෘති යෝජනා 306 ක් ලැබී ඇති අතර, ඒ සඳහා නිරන්තරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට දුෂ්කර වීම හේතුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන මිල දී ගැනීම් සිදු කළ බව දන්වා තිබුණි.	උපරිම තරඟකාරීත්වයෙන් යුතුව හා රජයට උපරිම වාසි සැලසෙන පරිදි තරඟකාරී මිල ගණන් කැඳවීමට පියවර ගත යුතුය.
(ඇ)	කොන්ක්‍රීට් කළ මාර්ග 05 ක ලොග් සටහන් වාර්තා අනුව මාර්ග කොන්ක්‍රීට් කළ දින හා තත්ත්ව වාර්තා අනුව කොන්ක්‍රීට් සාම්පල් ලබාගත් දින අතර වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් තත්ත්ව වාර්තා පිළිගත නොහැකි තත්ත්වයක පැවතුණි. .	ලොග් සටහන් පොතෙහි නිවැරදිව සඳහන් නොවීම හේතුවෙන් සාම්පල් ලබාගත් දිනයන් අතර වෙනස්කම් සිදු වී ඇත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදුනොවන අයුරින් කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බවට දන්වා තිබුණි.	විධිමත් පරීක්ෂාවක් සිදු කර අක්‍රමිකතාවන් සිදු කළ නිලධාරීන්ට පියවර ගත යුතු අතර මාර්ග තත්ත්ව පරීක්ෂා කිරීමෙන් පසුව රඳවා ගැනීම් මුදල් නිදහස් කළ යුතුය.
(ඇ)	ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කාවන්තිස්ස විහාර මාවත කොන්ක්‍රීට් කිරීමේදී මාර්ගයේ මීටර් 19.5 ක පමණ ප්‍රමාණයේ දෙපැත්තේ කාණු පැති බැම්ම පෙරළීමේ අවදානමක් තිබියදී කොන්ක්‍රීට් කිරීම හේතුවෙන් එම කොටස සඳහා දරණ ලද රු.342,389 ක පිරිවැයට අදාලව මාර්ගයේ දිගුකාලීන පැවැත්ම අවිනිශ්චිතව තිබුණි	මෙම මාර්ගය භාවිතා කරන ජනතාවගේ දැඩි ඉල්ලීම පිළිබඳව සලකා බලා මෙම ඉදිකිරීම සිදුකළ අතර පැති බැම්ම අප ආයතනය විසින් සිදුකළ ඉදිකිරීමක් නොවන අතර එය පෙර ඉදි කිරීමකි. එම නිසා මෙම ඉදිකිරීම සිදුකළ අතර එහි ගැටළුකාරී තත්වයක් නොපෙන්වන බව සඳහන් කර තිබුණි.	ව්‍යාපෘතිය ඉටුකිරීමේ දී ව්‍යාපෘතියේ ශක්‍යතාව සහ භෞතික පරිසරය පිළිබඳ පරීක්ෂා කළ යුතු අතර, පැති බැම්මේ ශක්තිමත්භාවය පිළිබඳව පරීක්ෂා කර සුදුසු පියවර ගත යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක වූ රජයේ ගොඩනැඟිලි 84 ක් නිෂ්කාර්යව පැවතුණි	ආපදා කටයුතුවලදී හා වෙනත් තාවකාලික කටයුතු සඳහා භාවිතයට ගැනීමේ අපේක්ෂාවෙන් තබාගෙන ඇති බව දන්වා තිබුණි.	ඌන උපයෝජිත වත්කම් උපයෝජනය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක පැවති ට්‍රැක්ටර්, ලොරි හා බවුසර් ඇතුලු වාහන 07 ක් වසර 4-7 ක් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	දිස්ත්‍රික්කය තුළ පවතින ට්‍රැක්ටර් රථ සහ ජල බවුසර්වල අවශ්‍යතාවය ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව තව දුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ඒවා රඳවා ගැනීමට තීරණය කර ඇති බව දන්වා තිබුණි.	නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කිරීමත්, අදාල වාහන යථා පැවැත්මෙන් තබා ගැනීමටද ක්‍රියා කිරීමත් කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක රජයට අයත් ඉඩම් වල ඇති ග්‍රාම නිලධාරී කාර්යාල 81 ක භූමි මැනුම් කර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ග්‍රාම නිළධාරී කාර්යාල පිහිටි ඉඩම් නිවැරදිව ප්‍රාදේශීය ලේකම් භාරයට ගැනීමට නොහැකි වී තිබීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණය නිවැරදි බවට පිළිගෙන තිබුණි.	විධිමත් පරිදි කටයුතු කර අදාළ ඉඩම් ප්‍රාදේශීය ලේකම් භාරයට ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඈ)	කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩමෙහි ප්‍රමාණය අක්කර 01යි රූඩ් 01යි පර්චස් 24 ක් සහ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය පිහිටි ඉඩමෙහි ප්‍රමාණය රූඩ් 01, පර්චස් 32 ක් වූ භූමි ප්‍රමාණයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ඉඩම් මැනුම් කටයුතු සඳහා යොමුකර ඇත. සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවස පිහිටි ඉඩම මැනුම් කටයුතු සිදුකර ඇතත් මේ දක්වා මැනුම් වාර්තා ලබාදී නොමැති බව දන්වා තිබුණි.	- එම -
(ඉ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පෙජරෝ රථය 2021 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර ඇති අතර මේ වන විටත් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි	මෙම රථය අපහරණය කිරීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත නිර්දේශ ලබා දී තිබුණි.	අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට ක්‍රියා කළ යුතුය.
(ඊ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව මුදල් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර සිදු කළ යුතු වුවත් බලංගොඩ හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගේ ග්‍රාම නිලධාරී කාර්යාල වල සමීක්ෂණ කටයුතු 2024 ඔක්තෝබර් 16 දින වන විටත් සිදු කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණය පවත්වා අවසන් වූ පසු කඩිනමින් 2024 වර්ෂයට අදාළව ග්‍රාම නිලධාරී කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර විගණනයට යොමු කරන බවට වාර්තා කර තිබුණි.	මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව ක්‍රියා කර භාණ්ඩ සමීක්ෂණ සිදු කර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ)	ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව වත්කම් අයිතම 445 ක් තිබුණද වටිනාකම රු 110,617,330 ක් වූ වත්කම් අයිතම 82 ක් පමණක් සිගැස් පරිගණක වැඩ සටහනට ඇතුළත් කර තිබුණි	ඉදිරියේ දී වත්කම් තක්සේරු මණ්ඩලය මගින් තක්සේරු කර CIGAS හා ඉන්වෙන්ට්‍රි ලේඛන තුලනය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	සියලු වත්කම් ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතුවීම.

4.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 880 හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරණ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ඇප තැබිය යුතු නිලධාරීන් 24 දෙනෙක් විසින් අදාළ ඇප මුදල් තැන්පත් කර නොමැති බවත්, මුදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන්ගෙන් නියමිත කාල සීමාව ඇතුළත ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඇප මුදල් තැන්පත් කිරීම සඳහා කටයුතු කරන බව දන්වා තිබුණි.	විධිමත් පරිදි ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන්ට පියවර ගැනීමටත් කඩිනමින් කටයුතු කර මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප මුදල් තැන්පත් කිරීමට ක්‍රියා කළ යුතුය.

4.7 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක වූ විශ්‍රාමිකයින් සඳහා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් වලින් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.10,006,332 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවැතිණි.	මෙම විශ්‍රාමිකයින්ගෙන් වැඩිපුර ගෙවන ලද මුදල් වාරික වශයෙන් මාසිකව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් අය කරමින් පවතින බව වාර්තා කර තිබුණි.	වැඩිපුර ගෙවීම් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කර ඊට නිලධාරීන් සම්බන්ධ නම්, විධිමත් පියවර ගැනීමටත්, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ආ)	අඩු ආදායම් ලාභීන් වෙත නොමිලේ සහල් බෙදා දීමට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 මගින් සමාන්‍ය වෙළඳපොළ පැවති මිලට වඩා වැඩි මිලට සහල් මිලදී ගැනීම හේතුවෙන් රු .53,848,550 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි.	අඩු මිලකට සහල් මිලදී ගැනීමට උත්සාහ කල නමුත්, ප්‍රමාණවත් සහල් තොග නොතිබීම හා සහල්වල ගුණාත්මක බව තහවුරු කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් රජය විසින් සහල් මිලදී ගැනීම සඳහා සහතික මිලක් නිර්දේශ කර ඇති විටක රත්නපුර දිස්ත්‍රික්කය තුළ එම සීමාව ඉක්මවා කටයුතු නොකිරීම මගින් රජයට පාඩුවක් සිදු වීමක් සිදු නොවී ඇති බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන කටයුතු පිරිමැසුම්දායක හා රජයට වඩාත් වාසිදායක වන පරිදි ක්‍රියාත්මක කළ යුතු අතර විධිමත් පරීක්ෂාවක් සිදුකර එසේ කර නොමැති නිලධාරීන්ට පියවර ගත යුතුය.

4.8 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කළු අදුර ප්‍රජා ශාලාවේ උළු සෙවිලි කළ වහලය නැවත සැකසීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන මත වහලය අලුත්වැඩියා කර ඇස්බැස්ටෝස් සීට් යෙදීමේදී ඇස්බැස්ටෝස් තහඩු සඳහා අඩුවෙන් ඇස්තමේන්තු පිලියෙල කිරීම මත ඇස්තමේන්තුව අනුව සීට් යෙදීම සඳහා අගුව කොටසේ වහලය අඩි 1.5 ක් කපා වහලය සැකසීම මගින් වර්ෂාවේදී බිත්ති තෙමීමට ලක්ව පැවතුණි.	මෙහි වහලයේ අඩු වූ අගුව නැවත පුළුල් කිරීමට කොන්ත්‍රාත්කාර සමිතිය එකඟ වී ඇති බැවින් ඒ සඳහා තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට දිස්ත්‍රික් ඉංජිනේරු වෙත යොමු කර එමගින් ලබා දෙන නිර්දේශ මත පදනම්ව එය නැවත සකස් කිරීමට කටයුතු කිරීමට සටහන් කරන බව දන්වා තිබුණි.	විධිමත් පරිදි ව්‍යාපෘතිය සැලසුම් නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, අවශ්‍යතා නිසිපරිදි හඳුනාගනිමින් ව්‍යාපෘති කටයුතු ඵලදායීව හා තාක්ෂණ නිළධාරියකුගේ මනා අධීක්ෂණය යටතේ සිදු කිරීමත් කළ යුතුය.

4.9 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජීවනෝපාය සංවර්ධනය, ධාරිතා සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ග්‍රාම ශක්ති ජනතා සමිති පිහිටුවා තිබුණු අතර ඒ සඳහා ලබා දී තිබුණු අරමුදලින් අක්‍රීය තත්ත්වයේ පවතින ග්‍රාම ශක්ති ජනතා සමිති 132 ක් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 132 ක	ක්‍රියාත්මක නොවන සමිති ගිණුම් වල මුදල් දිස්ත්‍රික් ලේකම්ගේ පොදු තැම්පත් ගිණුමේ තැම්පත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	විධිමත් වැඩපිළිවෙලක් යොදා නිෂ්කායීව පවතින මුදල් අපේක්ෂිත අරමුණට උපයෝජනය කිරීම හෝ සුදුසු පරිදි කටයුතු කර රජයට පවරා ගැනීම හෝ කළ යුතුය.

	රු.30,137,259 ක් වසර 04 ට අධික කාලයක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.		
(ආ)	ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 හා 2024 වර්ෂ වල ඉඩම් බලපත්‍ර පසු පැවරුම් ඉල්ලුම් කල ප්‍රතිලාභීන් 46 දෙනෙකු සඳහා 2024 දෙසැම්බර් 11 දින වන විටත් බලපත්‍ර ලබා දී නොතිබුණි.	බෙදා දී නොමැති බලපත්‍ර පසු පැවරුම් සඳහා ජනපද නිලධාරී වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කඩිනමින් සිදුකරන බව වාර්තා කර තිබුණි.	කාලීනව කාර්යක්ෂමතාවයකින් කටයුතු නොකළ නිලධාරින්ට පියවර ගැනීමත් බලපත්‍ර ලබාදීමේ කටයුතු කඩිනම් කිරීමත් කළ යුතුය.
(ඇ)	ඉඩම් කොමසාරිස්ගේ අංක 96/5 හා 1996.08.01 දිනැති චක්‍රලේඛයේ 6.11 ඡේදය ප්‍රකාරව ප්‍රදේශීය ලේකම් කාර්යාල 12 ක 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.39,053,701 ක් වූ හිඟ දීර්ඝකාලීන බදු මුදල් යාවත්කාලීනව අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ බදු මුදල් අයකර ගන්නා ලෙසට ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බවට වාර්තා කර තිබුණි.	හිඟ බදු මුදල් කාලීනව අය කිරීමට කටයුතු නොකළ සියළුම වගකිව යුතු පාර්ශව සම්බන්ධ පියවර ගැනීමටත්, හිඟ බදු කඩිනමින් අයකර ගැනීමටත් අවශ්‍ය පියවර ගත යුතුය.
(ඈ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක චක්‍රීය ණය වැඩසටහන යටතේ ලබා දී ඇති ණය මුදල් වාරික 10 කින් ආපසු ගෙවා අවසන් කළ යුතු වුවත් අයවීම් ප්‍රමාද කාලය වර්ෂ 01 ත් වර්ෂ-13 ත් අතර එකතුව රු.545,364 ක් හිඟ ණය ශේෂ පැවතුණි.	ණය මුදල අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදුකර අරමුණු කරා එය යොමුකර කාලීනව වාරික අයකර ගැනීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, හිඟණය මුදල කඩිනමින් අයකර ගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ඉ)	අඩු ආදායම් ලාභීන් සඳහා නොමිලේ සහල් බෙදා හැරීමට අදාළව 2024 අප්‍රේල් 04 දිනැති අංක සමාජ සවිබල ගැන්වීම/01/2024 දරන චක්‍රලේඛයෙහි 02 වගන්තිය ප්‍රකාරව තෝරාගත යුතු නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රතිලාභීන් හැර ප්‍රාදේශීය ලේකම් විසින් සහල් ලබා දිය යුතු යැයි නිර්දේශ කිරීම සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන් 15,805 ක තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සතුව නොතිබුණි	මෙම වැඩ සටහන ඉතා හදිසි හා අත්‍යවශ්‍ය කාර්යයක් වූ බැවින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සකසා ගත් ප්‍රතිලාභී ලේඛන මත කටයුතු කිරීමට සිදුවූ බවත්, ප්‍රතිලාභී සංඛ්‍යාව සාපේක්ෂව ඉහළ අගයක් ගත් බැවින් ප්‍රතිලාභීන් වෙන් වෙන්ව නාමලේඛන වශයෙන් සකසා අනුමැතියට යොමු කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ බවත් දන්වා තිබුණි.	විධිමත් පරීක්ෂාවක් සිදුකර ප්‍රතිලාභීන්ගේ තොරතුරු පවත්වා නොගැනීම සම්බන්ධයෙන් පියවර ගත යුතු අතර, අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

(ඊ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ (XXII) පරිච්ඡේදයේ 2.8 ඡේදය ප්‍රකාරව ආපනශාලාවක් (සුභසාධන සේවයක්) දෙපාර්තමේන්තු නිලධාරීන් මගින් හෝ කොන්ත්‍රාත්තුවක් යටතේ පවත්වා ගෙන යා හැකි වුවත් කොන්ත්‍රාත් ක්‍රමයට ලබා දේ නම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් තොරව ආපනශාලා ලබා දී තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් ආපනශාලාවෙන් ලබන මාසික ගාස්තු රජයේ ආදායමට බැර කර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.2 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කර එහි ආපනශාලාව පවත්වාගෙන යනු ලබන කාලය, මාසික කුලිය, ජලය හා විදුලිය සඳහා ගෙවීම් කළ යුතු ආකාරය සම්බන්ධව කොන්දේසි ඇතුලත් කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේදී එයට ලැබෙන ආදායම ද රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ යොමුගත ඡේදය ප්‍රකාරව කටයුතු කළයුතු අතර, ආපනශාලා ගාස්තු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.

5. **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අරමුණ හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කිරීමක් ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කර ගැනීමක් හෝ මගපෙන්වීමක් සිදු කර නොතිබුණි.	තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම තිරසර සංවර්ධන සභාව මගින් කළ යුතු වීම මත මාර්ගෝපදේශ ලබා නොදීම හේතුවෙන් අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම සිදුකර නොමැති බව දන්වා තිබුණි.	අපේක්ෂිත ඉලක්ක ලගාකර ගැනීම සඳහා තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

6. **යහපාලනය**

6.1 **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් දීමනා පත්‍ර 4 ක් ජනාධිපතිවරයා විසින් අත්සන් කර වසර 1 ත් 5 ත් අතර කාලයක් ගත වුවද, 2024 දෙසැම්බර් 20 දින වන විටත් අදාල පාර්ශව වෙත බෙදා හැර නොතිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලද බලපත්‍ර 29 ක් වසර 1 ත් 4 ත් අතර කාලයක් ගත වුවද අදාල පාර්ශව වෙත බෙදා හැර නොතිබුණි.	පූර්වගාමී උපදෙස් මත උත්සව අවස්ථාවලදී බෙදා දීම සඳහා මෙම දීමනාපත්‍ර රඳවාගත් බවත්, 2024 ජනවාරි මස සිට මේ දක්වා ලද දීමනා පත්‍ර මහජනයා වෙත බෙදාදීම සිදුකර ඇති බවත්, 2025 පළාත් පාලන මැතිවරණය අවසන් වූ පසු ඉතිරි දීමනාපත්‍ර බෙදා දීමට කටයුතු කරන බව වාර්තා කර තිබුණි.	ලේඛන කටයුතු නිමවූ පසු අදාළ දීමනාපත්‍ර රඳවා නොගෙන කඩිනමින් බෙදා දීමට කටයුතු කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුය.

(ආ)	ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත ජනාධිපති හා අගමැති කාර්යාලයෙන් 2024 මැයි 31 දිනෙන් පසුව ලද මහජන පැමිණිලි 10 ක් පොදු මහජන පැමිණිලි 09 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලද පැමිණිලි 04 ක් ලේඛන ගත කිරීමෙන් තොරව 2024 අගෝස්තු 05 දින වන විටත් පැවැතුණු අතර එම මහජන පැමිණිලි විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	1929 පැමිණිලි පරීක්ෂා ලේඛනයේ දක්වා ඇති අතර විගණන විමසුමේ සඳහන් අනෙකුත් අඩුපාඩු 2025 වර්ෂයේ සිට සකසා ගන්නා බව දන්වා තිබුණි.	විධිමත් පරිදි පැමිණිලි ලේඛනගත නොකළ හා කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් මහජනයාගේ ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය.

7. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව සේවක පුරප්පාඩු 313 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 481 ක් බව නිරීක්ෂණය විය.	අතිරික්ත හා පුරප්පාඩු පිළිබඳව අදාළ පත්වීම් බලධාරියා වෙත දන්වා ඇති බව සඳහන් කර තිබුණි.	කාර්ය මණ්ඩල සමාලෝචනය සිදු කර අත්‍යවශ්‍යම පුරප්පාඩු පිරවීමටත්, අතිරික්ත සේවක මණ්ඩල වෙනත් ආයතන වෙත විධිමත්ව අනුයුක්ත කර තුලනය කර ගැනීමටත් පියවර ගත යුතුය.